" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන /தொலைபேசி/ Telephone - 011 - 2092599
ෆැක්ස් /பெக்ஸ்/ Fax - 011 - 2092601
ඊ-මේල් /மின்னஞ்சல்/ E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM18-38FI/05-2022 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | |
| දිනය / திகதி / Date | 2022.08.03 | | |

පාලන චක්‍රලේඛ 09/2022

ආණ්ඩුකාර ලේකම්(බ.ප.),

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.),

සභා ලේකම්(බ.ප.),

ලේකම් (පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය(බ.ප.)

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු),

පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),

ප්‍රධාන නීති නිලධාරි, නීති ඒකකය(බ.ප.),

අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන ඒකකය(බ.ප.)

ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/ පරිපාලන නිලධාරී

<u>ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධාරීන්ට දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම.</u>

උක්ත ශිර්ෂය යටතේ රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2022.06.22 දිනෙන් යුතුව නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 දරණ චක්‍රලේඛයෙහි 4 (ක) ඡේදය යටතේ සඳහන් උපදෙස් අනුව පහත මාර්ගෝපදේශ ඉදිරිපත් කරමි.

(01). රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 චක්‍රලේඛයට අනුව බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්/ සේවකයින් විදේශ නිවාඩු අයදුම් කිරීමේ දී එම නිවාඩු අනුමත කිරීම සම්බන්ධයෙන් වන බලධාරිත්වය මේ තාක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවය තුළ ඒ ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු යටතේ නිලධරයන්/ සේවකයින් සම්බන්ධයෙන් විදේශ නිවාඩු අනුමත කිරීම සඳහා මෙතෙක් ක්‍රියා කළ ආකාරයටම අදාල බලධාරිත්වය විසින් සිදු කල යුතු ය.

(02). එසේම අදාළ විදේශ නිවාඩු අනුමත කිරීමේ දී, එසේ අනුමත කරනු ලබන්නේ අදාළ චක්‍රලේඛනයේ 2 වන ඡේදය යටතේ ද, නැතහොත් 3 වන ඡේදය යටතේ ද යන්න හා එසේ 2 වන ඡේදය යටතේ නිවාඩු අනුමත කරනු ලබන්නේ නම් එහි (අ) අක්ෂර යටතේ ද, නැතහොත් (ආ) අක්ෂරය යටතේ ද යන්න නිශ්චිතව තහවුරු කර තිබිය යුතු ය.

(03). අදාළ වැටුප් රහිත නිවාඩු අනුමත කිරීමට පූර්වයෙන් පහත සඳහන් කරුණු විදේශ නිවාඩු අයදුම් කරන අවස්ථාවේ සම්පූර්ණ වී ඇති බවට තහවුරු කර තිබිය යුතු ය.

(අ) ඉල්ලුම්කරු දරනු ලබන තනතුරට අදාළව රාජකාරි බිඳවැටීමකින් තොරව පවත්වා ගෙන යාමට නිසි හා යෝග්‍ය වැඩපිළිවෙළක් යෙදී ඇති බව.

(ආ). ඉල්ලුම්කරු පළාත් රාජ්‍ය සේවයේ බැඳියාවන් සමඟ බැංකු මගින් ලබා ගත් ණය මුදල් ඇත්නම් එම සියලු ණය මුදල් ගෙවා නිම කර ඇති බවට අදාල බැංකුව වෙතින් කරන ලද තහවුරුවක් ඉදිරිපත් වී ඇති බව.

(ඇ) ඉල්ලුම්කරු පරිවාස සේවා කාලය තුළ සිටින නිලධාරියකු නම් හා බස්නාහිර පළාත් කාර්ය පටිපාටි රීති අනුව සම්පූර්ණ කල යුතු අවශ්‍යතා විදේශ නිවාඩු අවසන් වී වසර තුනක් ඇතුළත සම්පූර්ණ කරන බවට ලිඛිත ප්‍රකාශයක් ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කර ඇති බව,

(04). තවද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 යටතේ විදේශ නිවාඩු අනුමත කරනු ලබන සියලුම නිලධාරීන් සම්බන්ධයෙන් විදේශ නිවාඩු අනුමත කිරීමට පූර්වයෙන් එම චක්‍රලේඛයේ (ඔ) යටතේ ඇමුණුම 1 වශයෙන් දක්වා ඇති ගිවිසුම වෙනුවට මෙම උපදෙස් සමඟ නිකුත් කරනු ලබන ගිවිසුමට නිවාඩු අනුමත කරනු ලබන බලධරයා හා ඉල්ලුම්කරු විසින් ඇතුලත් විය යුතු ය.

(05). එසේම නිවාඩු අනුමත කිරීම සඳහා බලය පැවරී ඇති බලධාරිත්වය විසින්, නිවාඩු අනුමත කිරීමට පූර්වයෙන් ඊට අදාළ අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බවට නිර්දේශ ලබා ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 චක්‍රලේඛයේ 4 (ක) ඡේද යටතේ වන උපදෙස් වලට අනුකූල වන පරිදි නිසි සංයුතියකින් යුක්තව පත්කර ගනු ලබන කමිටුවක් මඟින් ඊට අදාළ නිර්දේශ ලබා ගැනීම සඳහා ක්‍රියා කල යුතු ය.

(06). තවද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 සම්බන්ධයෙන්, ඉදිරියේ දී නිකුත් කරනු ලබන කවර හෝ උපදේශයක් ඇත්නම් ඊට යටත්ව අදාල විදේශ නිවාඩුව ක්‍රියාත්මක විය යුතු බව ද, අවධාරණය කරමි.

(07). තව ද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 යටතේ දේශීය වැටුප් රහිත නිවාඩු අයදුම් කිරීමේ දි පහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු ය. එනම්, දේශීය වැටුප් රහිත නිවාඩු අයදුම් කරන ඉල්ලුම්කරු බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ බැඳියාවන් සමඟ ලබාගෙන ඇති ණය මුදල් ඇත්නම්

ඊට අදාළ ණය වාරික හා අදාළ පොලී මුදල ද සමග ගෙවා නිම කර තිබීම හෝ ගෙවා නිම කර ඇති බවට බැංකුව මගින් සනාථ කර තිබීම හෝ නිවාඩු කාලසීමාව තුළ අදාළ ණය සම්බන්ධයෙන් පළාත් රාජ්‍ය සේවයේ බැඳීම් වලින් නිදහස් කර බැංකු එකඟ වන ණය මුදල් ගෙවීම සම්බන්ධයෙන් සුදුසු වැඩපිළිවෙළකට ඇතුළත් වී ඇති බවට බැංකු කළමනාකාරිත්වය විසින් තහවුරු කර තිබිය යුතු ය.

(08). එසේම දැනටමත් විදේශ නිවාඩු මත කටයුතු කරමින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 යටතේ විදේශ නිවාඩු හිමිකම ලබා ගැනීමට අපේක්ෂා කරන්නෙකු ඊට අදාල ඉල්ලුම්පත්‍රය පිළිගත හැකි ආකාරයට විදේශ නිවාඩු අනුමත කළ බලධාරීත්වය වෙත ඉදිරිපත් කල යුතු අතර, ඊට අදාළ විදේශ නිවාඩු අනුමත කිරිමට මෙම උපදෙස් යටතේ හඳුන්වා දී ඇති ගිවිසුම සඳහා දෙපාර්ශවය ඇතුළත් විය යුතු ය. අදාල ගිවිසුමට විදේශ ලිපිනය ඇතුළත් වේ නම්, ඉල්ලුම්කරු ගිවිසුම තුළ නියෝජනය වීම අදාල විදේශ තනාපති කාර්යාල/ මහා කොමසාරිස් කාර්යාල / කොන්සල් ජනරාල් කාර්යාලය මගින් ඉදිරිපත් කිරිම සිදු කල යුතු ය.

(09). රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හා මෙම උපදෙස් යටතේ විදේශ නිවාඩු අනුමත කරන නිලධාරින් පිළිබඳ විස්තර ඇතුලත් වාර්තාවක් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් විසින් පවත්වා ගෙන යා යුතු අතර ඒ අනුව අදාල නිලධරයන් සම්බන්ධයෙන් තොරතුරු ඔවුන්ගේ පත් කිරීම් බලධරයන් වෙත මාසිකව වාර්තා කල යුතු ය.

(10). ඉහත කරුණු සැළකිල්ලට ගනිමින් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවය තුළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 චක්‍රලේඛයේ උපදෙස් ක්‍රියාත්මක විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම්.
බස්නාහිර පළාත.

# ගිවිසුමයි.

මෙහි පහත ඇතැම් තැනක පළමු පාර්ශවය ලෙස හඳුන්වනු ලබන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ ................................................ (අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ නම) ලේකම් / .................... වන ............................................... යන අය (අනුප්‍රාප්තිකව එම තනතුරට ස්ථිරව හෝ වැඩ බැලීම සඳහා පත්වන අයද සමඟ) එක් පක්ෂයකට ද, මෙහි ඇතැම් තැනක "දෙවන පාර්ශවය" ලෙස හඳුන්වනු ලබන .................................................. (අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ නම) සේවය කරන බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ .......................................... තනතුරක් දරණ ........................................................................................................................................... යන ලිපිනය ඇති .................................................... යන අය අනෙක් පාර්ශවය වශයෙන්ද ඇති කරගන්නට යෙදෙන ගිවිසුමයි.

ඉහත කී දෙවන පාර්ශවය විසින් රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ලේකම්ගේ අංක EST-6/03/LEA/3162(1) හා 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 චක්‍රලේඛයෙහි විධි විධාන ප්‍රකාරව ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොමැතිව විදේශීය වැටුප් රහිත නිවාඩු පළමු පාර්ශවය වෙතින් ඉල්ලුම් කිරීමට අපේක්ෂා කර ඇති හෙයින්ද, එකී පළමු පාර්ශවය වෙතින් ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 චක්‍රලේඛයෙහි විධිවිධානයන්ට අනුකූලව කරනු ලබන ඉල්ලීමකදී ඊට අදාළව ඉල්ලුම්කරුගේ ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි වැටුප් රහිත නිවාඩු ලබා දීමට පළමු පාර්ශවය එකඟ වන හෙයින්ද විදේශ නිවාඩු කාල සීමාව තුළ ඉහත කී රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 චක්‍රලේඛයට අනුකූලව දෙපාර්ශවය අතර කටයුතු පවත්වාගෙන යාම පිළිබඳව එකී දෙපාර්ශවය විසින් පහත කොන්දේසි සහ බැඳීම් වලට යටත්ව මෙම ගිවිසුමට ඇතුළත් වේ.

ඉහත කී කොන්දේසි සහ බැඳීම් කවරේද යත්;

1. රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙහි ලේකම්ගේ අංක EST-6/03/LEA/3162(1) හා 2022.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2022 චක්‍රලේඛය ( මෙහි මින් මතු රා.ප.ච.අංක 14/2022 යනුවෙන් හඳුන්වන) මෙම ගිවිසුමෙහි කොටසක් වශයෙන් පිළිගනිමින් එකී චක්‍රලේඛණයෙහි කොන්දේසි හා නියමයන්ට අනුකූලව මෙම ගිවිසුම තුළ එකඟ වන නිවාඩු කාලසීමාව තුළ කටයුතු කිරීමට දෙපාර්ශවයම එකඟ වෙයි.

2. රා.ප.ච.14/2022 චක්‍රලේඛය යටතේ දෙවන පාර්ශවය විසින් විදේශ නිවාඩු අයදුම් කිරීමේදී සහ පළමු පාර්ශවය විසින් ඊට අදාළ විදේශ නිවාඩු අනුමත කිරීමේදී රා.ප.ච.14/2022 චක්‍රලේඛයෙහි සඳහන් විධි විධාන ඊට අදාළ රජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන හා සමාන්තරව ක්‍රියාත්මක විය යුතු බව දෙපාර්ශවය පිළිගනියි.

3. පළමු පාර්ශවය දෙවන පාර්ශවය වෙත රා.ප.ච.14/2022 යටතේ විදේශ නිවාඩු අනුමත කිරීමේදී, එම චක්‍රලේඛයෙහි 2 සහ 3 ඡේද අවස්ථාවෝචිත පරිදි අදාළ විය යුතු බවද දෙපාර්ශවය පිළිගනියි.

4. රා.ප.ච.14/2022 යටතේ අනුමත විදේශ නිවාඩු කාල සීමාව තුළ එම චක්‍රලේඛයෙහි උපදෙස් හා නියමයන්ට යටත්ව සෑම විටම ක්‍රියා කිරීමට දෙවන පාර්ශවය එකඟ වේ.

5. දෙවන පාර්ශවය විසින් මෙම ගිවිසුමට අදාළ විදේශ නිවාඩු කාල සීමාව තුළ රා.ප.ච.14/2022 චක්‍රලේඛණයෙහි උපදෙස්, කොන්දේසි හෝ නියමයන් නොසලකා හරිමින් හෝ පැහැර හරිමින් හෝ කඩකරමින් කටයුතු කර ඇති බව තහවුරු වන කවර හෝ අවස්ථාවක දෙවන පාර්ශවයට අදාළ රා.ප.ච.14/2022 යටතේ චක්‍රලේඛය යටතේ හිමිවුනු බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨත්වයට හා විශ්‍රාම වැටුපට අදාළ හිමිකම් සම්බන්ධයෙන් හෝ එම චක්‍රලේඛණය යටතේ හිමිවූ වෙනත් කවර හෝ හිමිකමක් සඳහා තමන්ට අයිතිවාසිකමක් නොමැති බව දෙවන පාර්ශවය පිළිගනියි.

6. දෙවන පාර්ශවයට විදේශ නිවාඩු කාල සීමාව තුළ රටින් බැහැරව සිටින කාල සීමාවේදී රා.ප.ච.14/2022 චක්‍රලේඛයට අනුව නිවාඩු අනුමත කරන දිනට හිමි මූලික වැටුපට අදාළ වැන්දඹු අනත්දරු / වැන්දඹු පුරුෂ දායක මුදල් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත විදේශ මුදලින් ප්‍රේෂණය කිරීමේදී ඊට අදාළ තහවුරුවක් පළමු පාර්ශවයට යොමු කිරීමට දෙවන පාර්ශවය එකඟ වෙයි.

ඉහත කී කොන්දේසීන්ට යටත් පහත නම් සඳහන් සාක්ෂිකරුවන් ඉදිරියේ ඉහත කී දෙපාර්ශවය විසින් මෙම ගිවිසුමට හා මේ හා සමාන තවත් ගිවිසුමකට වර්ෂ 2022 ක් වූ .............................. මස ............දින ........................... දී අත්සන් තබන ලදී.

**පළමු පාර්ශවය වෙනුවෙන්**

අත්සන : ............................................

නම : ..................................................................................

(ජාතික හැඳුනුම්පත් අංකය - )

නිල මුද්‍රව

**දෙවන පාර්ශවය වෙනුවෙන්**

අත්සන : ............................................

නම : ..................................................................................

(ජාතික හැඳුනුම්පත් අංකය - )

නිල මුද්‍රව

**සාක්ෂි :**

1. අත්සන :
   නම :
   ජාතික හැඳුනුම්පත් අංකය :
   ලිපිනය :

2. අත්සන :
   නම :
   ජාතික හැඳුනුම්පත් අංකය :
   ලිපිනය :